# 15.වටපිටාවේ වෙනස් තැන්

## ක්‍රියාකාරකම 1

- ❖ දරුවා සමඟ ගෙවත්තේ චාරිකාවක යෙදෙන්න. එහිදී පොළොව සමතලා කර තිබෙන තැන් , පඩිපෙළ, මල් පාත්ති , වතුර කරාම තිබෙන ස්ථාන ආදිය පිළිබඳව අවධානය යොමු කරන්න. මේවා තැනීම සඳහා පොළොව වෙනස් කර ඇති ආකාරය කථා කරන්න.

- ❖ පදම් කළ මැටි , ලී කෝටු, වර්ණ ශාක පත්‍ර, ඉරටු , ලැලි කෑලි ආදිය යොදා ගනිමින් දුටු භූමියේ ආකෘතියක් නිර්මාණය කිරිමට දරුවා යොමු කරන්න.

## ක්‍රියාකාරකම 2

- පහත දී ඇති වැකි අතුරින් පරිසරයට හිතකර වැකි සඳහා (√) ලකුණ ද පරිසරයට හානි කර වැකි සඳහා ( × ) ලකුණ ද කොටුව තුළ යොදන්න.

01. දිනපතා අවට පරිසරය අතු ගා කුණු එකතු කර දැමීම. ( )
02. කුණු කසළ නිසි ස්ථානයකට දැමීම. ( )
03. වල් පැළ ගලවා ඉවත් කිරිම. ( )
04. අනවශ්‍ය ලෙස වැඩී ඇති ගස් වල අතු කපා ඉවත් කිරීම. ( )
05. කඩදාසි හා පොලිතීන් තැන තැන දැමීම. ( )
06. ඉතිරි වන කෑම තැන් තැන් වල දැමීම. ( )
07. දිය සෙවල බැඳි ඇත්නම් ඒවා ඉවත් කිරීම. ( )
08. පොලිතීන් බෑග් නිසි ආකාරයට බැහැර කිරීම. ( )
09. දිය සෙවල බැඳි ඇත්නම් ඒවා ඉවත් කිරීම. ( )
10. කුණු කසළ බැහැර කිරිමේ දී දිරා යන හා දිරා නොයන ලෙස වර්ග කර වෙන් කිරිම. ( )

# ක්‍රියාකාරකම 3

- පොළොවේ බෑවුමක් ඇති ස්ථානයක් තෝරා ගන්න. ජල බඳුනක් ගෙන බෑවුමේ යම් ස්ථානයක සිට පහළට ජලය වක් කිරීමට දරුවා යොමු කරන්න.
- දුටු දේ ලියා ඇඳිමට යොමු කරන්න.

- සමතලා පොළොවක් ඇති ස්ථානයකට ගොස් ජෝගුවකට හෝ කේතලයකට ජලය ගෙන එහි යම් ස්ථානයකට ජලය වත් කිරිමට දරුවා යොමු කරන්න.
- දුටු දේ ලියා ඇඳිමට යොමු කරන්න.

- ❖ දරුවා සමඟ ගෙවත්තට යන්න.
- ❖ මතු පිට පස් තට්ටුව සෝදා ගිය ස්ථානයකින් හා මතු පිට පස් තට්ටුව සෝදා නොගිය පෙහොර සහිත ස්ථානයකින් පස් ස්වල්පයක් බැගින් වෙන් වෙන්ව ගන්න.එම පස් දෙවර්ගය හොඳින් නිරීක්ෂණයට යොමු කරන්න.
- ❖ එම පස් වර්ග දෙක විනිවිද පෙනෙන වීදුරු බඳුන් දෙකකට දමන්න.
- ❖ ඒවාට ජලය සමාන ප්‍රමාණ වලින් දමා හොඳින් කැලතීමට දරුවා යොමු කරන්න.
- ❖ මද වේලාවකින් පසු බඳුන් දෙක නිරීක්ෂණයට යොමු කරන්න.
- ❖ පස සේදී නොගිය ස්ථානයක උදැල්ලකින් පස් පිඩක් ඉවත් කර එය නිරීක්ෂණයට දරුවා යොමු කරන්න.
- ❖ මතු පිට මෘදු සරු පසක් ඇති බැවින් යට පස් තට්ටුව තද නිසරු පස් බවත් දරුවාට දෙන්න.

- පස සේදීයෑම වැළැක්වීමට යොදා ගත හැකි ක්‍රියා මාර්ග දැක්වෙන වගන්ති යටින් ඉරි අඳින්න.

  - ❖ ගල් වැටි බැඳීම
  - ❖ පොල් ලෙලි තැබීම.
  - ❖ පිඩලි ඇල්ලීම
  - ❖ වළවල් කැපීම
  - ❖ ගල් ඉවත් කිරීම
  - ❖ කාණු යෙදීම
  - ❖ උණ බට වැනි දෑ යොදා ගෙන එවැනි ස්ථාන හරස් කර බැඳිම.
  - ❖ ගස් සිටු වීම හා සිටුවා ඇති ගස් ආරක්ෂා කිරිම.

- ගෙවත්තේ මතු පිට පස සෝදාගිය ස්ථාන තෝරා ගෙන දරුවා සමඟ එක්වී ඉහත දක්වා ඇති එක් ක්‍රමයක් අනුගමනය කරමින් මතු පිට පස ආරක්ෂා කිරීමේ වැදගත්කම දරුවාට පහදා දෙන්න.

## ක්‍රියාකාරකම 4

- ❖ දරුවා ඉඩකඩ සහිත ස්ථානයකට රැගෙන යන්න.
- ❖ ක්‍රියාකාරකම් කිරීමට සීමාවක් ලකුණු කරන්න.
- ❖ එම සීමාවේ තෝරාගත් ස්ථාන කිහිපයක රවුම් අදින්න.
- ❖ එම ස්ථාන වල කටු සහිත ස්ථානයක්, මඩ සහිත, ස්ථානයක්, වළක්, ඇළක් ආදී වශයෙන් පුවරු සවි කරන්න.
- ❖ මේවා බාධක බව දරුවාට කියා දෙන්න.
- ❖ සංඥාවකට අනුව මෙම සියලු බාධක මතින් පනිමින් දුවගෙන ගොස් නැවත ආරම්භක ස්ථානයට පැමිණීමට දරුවා යොමු කරන්න.

## ක්‍රියාකාරකම 5

- **පහත සඳහන් දෑ සපයාගන්න.**
    - ❖ ටොනික් මූඩි පියන් තලා මැදින් හිල්කර කම්බියක දමා සකස් කර ගත් වළල්ලක හැඩයකින් යුත් භාණ්ඩයක්
    - ❖ X – ray කාඩ් එකක් යොදා සකසා ගත් බෙරයක්.
    - ❖ ටින් දෙකක් දමා තනාගත් තම්මැට්ටමක්.
    - ❖ හොඳින් සුද්ද කර ගත් පොල් කටු දෙකක්.
    - ❖ ඇලුමිනියම් හැඳි දෙකක්
    - ❖ එක සමාන ලී පොලු දෙකක්

- මෙම ආදේශ භාණ්ඩ මඟින් නාදය නිපදවන ආකාරය සොයා බැලීමට දරුවා යොමු කරන්න.

- පරිසරයේ ඇසෙන පහත දැක්වෙන ශබ්ද, මෙම භාණ්ඩ ඇසුරින් නිපදවිය හැකි දැයි අත්හදා බැලීමට යොමු කරන්න.
    - ❖ වැස්සක් වහිනවා
    - ❖ කෝච්චියක් ගමන් කරනවා
    - ❖ පාරේ වාහන යනවා
    - ❖ අහස් යානාවක් යනවා
    - ❖ කොත්තු ගහනවා